## සී බැන්ක් හොලිඩේ හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2017

----------------------------------------------------------

සී බැන්ක් හොලිඩේ හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ("සමාගම") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ( "Board") වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**2.1** **මතය**

**------**

2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.1.2** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**

**------------------------------------------------------------------------------------**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 ( 2 ) වගන්තියෙහි නියම කර ඇති පරිදි පහත සඳහන් කරුණු මම ගෙනහැර දක්වමි.

( අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමාකිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ දරන්නා වූ මතය නම්,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------**

**2.2.1** **නොසැසඳුනු සහ හඳුනා නොගත් වෙනස්කම්**

**---------------------------------------------**

සුභසාධන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද වෙන්කිරීම් සඳහා ලද මුදල හඳුනාගැනීමට විධිමත් ක්‍රමවේදයක් පවත්වා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2017 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් තැන්පතුවක් ලෙස රු . 1,170,629 ක මුදලක් ඉතිරි වී තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 වසර තුළදී රු. 2,751,826 ක බදු පෙර ලාභයක් වාර්තා කර තිබූ අතර ඊට ප්‍රතිරූපීව පෙර වර්ෂයේ අදාළ බදු ගෙවීමට පෙර පාඩුව රු. 151,600 ක් වූයෙන් ලාභයෙහි රු. 2,903,426 ක වැඩිවීමක් විය. සමාලෝචිත වර්ෂය තුළ ලංකා බැංකුවෙන් ජල බිල්පත් සහ විදුලි බිල්පත් ප්‍රතිපූරණය කර තිබීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2** **වැදගත් ගිණුම්කරණ අනුපාත**

**--------------------------------**

විගණනය සඳහා ලබා දුන් මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරු අනුව, පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා සමහර වැදගත් අනුපාතයන් පහත දැක්වේ.

| අනුපාතය | 2017 | 2016 |
|---|---|---|
| **ලාභ අනුපාතිකය ( ප්‍රතිශතය )** | | |
| ශුද්ධ ලාභ අනුපාතය | 1.46 | (0.32) |
| සමස්ත වත්කම් මත ප්‍රතිලාභ | 5.19 | (1.63) |
| හිමිකම මත ප්‍රතිලාභ | 76.36 | (72.53) |
| **ද්‍රවශීලතා අනුපාතය - (වාර ගණන)** | | |
| ජංගම අනුපාතය | 0.89 | 0.72 |

පසුගිය වසරට සාපේක්ෂව 2017 වසරේ දී සමාගමේ සමස්ත කාර්යසාධනය, ද්‍රවශීලතා අනුපාතය සහ ලාභදායී අනුපාතයන් වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 12 හි 5.1 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

#### 4.1.2 මෙහෙයුම් සහ සමාලෝචනය

(අ) සමාගමෙහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමකින් තොරව ලංකා බැංකු භෝජනාගාර හතරක් නිවාඩු නිකේතන 7 ක්, කාර්ය මණ්ඩල නිල නිවාස විසිතුනක් හා එකඟ වූ කළමනාකරණ ගාස්තු යටතේ ලංකා බැංකු සේවක සුබසාධනය සඳහා මහරගම පුහුණු ආයතනය සඳහා ලංකා බැංකුවේ කලමනාකරණ නියෝජිතයා ලෙස සමාගම ක්‍රියා කරනු ලැබේ.

(ආ) ලංකා බැංකුව වෙතින් කතරගම සහ අනුරාධපුරයේ පිළිවෙලින් රු. 2,109,942 ක් සහ රු. 5,387,556 ක විදුලිය සහ ජල බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම හේතුවෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කතරගම සී බැන්ක් රෙස්ට් හි අලාභය සියයට 68.8 කින් අඩුවී අනුරාධපුර සී බැන්ක් රෙස්ට් හි ලාභය සියයට 127.6 කින් වැඩිවී තිබුණි. තවද, පවතින ගොඩනැගිලිවල හා එහි ස්ථාපිත උපකරණ පිළිබඳ දුර්වල තත්ත්වය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී දික්ඔය ග්ලේන්කර්න් බංගලාවෙහි රු. 752,821 ක සැලකිය යුතු පාඩුවක් පෙන්නුම් කරන විට නුවරඑළිය සී බැන්ක් රෙස්ට්හි ලාභය රු. 2,201,926 කින් අඩුවී තිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ පොදු වියදම් රු. 11,455,159 ක් එක් එක් පිරිවැය මධ්‍යස්ථානය සඳහා වෙන්කර නොතිබුණි.

## 4.2. කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කතරගම සහ අනුරාධපුරයේ සී බෑන්ක් රෙස්ට් සඳහා කුලී ගිවිසුම් 2014 දෙසැම්බර් 31 දින කල් ඉකුත් වී තිබුණු අතර 2015 ජනවාරි සිට අළුත්කිරීමක් සිදු කර නොතිබුණි. තවද, නුවරඑළිය සී බෑන්ක් රෙස්ට් ඇන්ඩ් හොලිඩේ හෝම්ස් සඳහා කුලී ගිවිසුමක් ද නොතිබුණි.

(ආ) මූළුතැන්ගෙය හා ජලාපවහන පද්ධතියේ දුර්වල තත්ත්වය හේතුවෙන් නුවරඑළිය සී බෑන්ක් රෙස්ට් "A" ශ්‍රේණියේ සිට "A ශ්‍රේණියේ R " දක්වා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් පහත හෙලා තිබුණි.

(ඇ) ප්‍රමාදවී ගෙවීම් කිරීම හේතුවෙන් සමාගම විසින් ජල බිල්පත් සහ විදුලි බිල්පත් සඳහා දඩලෙස රු . 85,058 ක් වැය කර තිබුණි.

(ඇ) භෝජනාගාරවල හානිවූ භාණ්ඩ ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ආවරණය කිරීම සඳහා සේවකයින්ගේ මාසික සේවා ගාස්තුවෙන් සියයට 10 ක් පවත්වාගැනීම සමාගමේ පරිචය වේ. 2017 දෙසැම්බර් 31 දිනට ඉහත ගිණුමේ ඉතිරිව තිබූ ශේෂය රු. 3,178,454 ක් විය. කෙසේවෙතත්, ඉහත ගිණුමේ ඉතිරි ශේෂය සේවකයින් අතර සෑම වර්ෂයකම බෙදා හැරීමට සමාගම කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ශේෂය වසර ගණනාවක් තුළ සමුච්චිත වී තිබුණි. තවද, මෙම අරමුදල භාවිතා කර හානිවූ භාණ්ඩ වෙනුවට මිලදී ගත් උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබූ අතර ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

## 4.3 මානව සම්පත් කළමනාකරණය

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 12 හි 9.2 වගන්තිය අනුව සමාගම එහි කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය සමාලෝචිත වර්ෂ අවසානය දක්වාම ලබාගෙන නොතිබුණි.

## 4.4 ස්ථාවර වත්කම් සත්‍යාපනය

විගණකාධිපති විසින් පත් කරන ලද බාහිර විගණකවරයා සමාගම විසින් සී බෑන්ක් රෙස්ට්වලට අයත් ස්ථාවර වත්කම් සත්‍යාපනය සඳහා සේවා සැපයුම්කරු ලෙස පත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ඉහත කටයුත්ත පැවරීමේදී සමාගම විසින් විගණකාධිපතිවරයාගේ කැමැත්ත ලබාගෙන නොතිබුණි.

**(ආ)** සමාගමට තරඟකරුවන් හරහා ප්‍රශස්ත වාසි ලබා ගැනීම සඳහා වෘත්තීමය සේවා සපයන්නන් කිහිප දෙනෙකුගෙන් මිල ගණන් කැඳවා නොතිබුණි.

**(ඇ)** ඉහත සඳහන් සේවා සැපයුම්කරුගේ කාර්යභාරය සඳහා ඉන්වොයිස් මුදල රු. 759,268 ක් වන අතර මෙම පැවරුම සඳහා සමාගමෙහි කාර්ය මණ්ඩලය යොදවා ගැනීමේ හැකියාව සමාගම විසින් සලකා නොතිබුණි. එම පැවරුමේ විෂය පථය සමාගමට අයත් ස්ථාවර වත්කම් හඳුනා ගැනීමටත්, ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමටත් සීමා වී තිබුණි. එහෙත් එම කාර්ය පැවරුමෙන් ආවරණය නොවූ ලංකා බැංකුවට හා නාගරික සංවර්ධන අධිකාරිය වැනි අනෙකුත් බාහිර පාර්ශවයන්ට අයත් බොහෝ වත්කම් විය.

(ඇ) 2017 පෙබරවාරි 04 දින කාර්ය පැවරුම ආරම්භ කර තිබුණත් 2018 මාර්තු 07 දින වාර්තාව ඉදිරිපත් කර තිබුණි. .

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------

**5.1 විගණන හා කළමනාකරණ කමිටු**

------------------------------------

2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 12 හි 7.4.1 වගන්තිය යටතේ අවම වශයෙන් මාස තුනකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාගම සමාලෝචිත වර්ෂය තුළදී එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් හෝ පවත්වා නොතිබුණි.

**6. පද්ධති සහ පාලනයන්**

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනලද විස්තරාත්මක වාර්තාවෙන් සමාගමේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණයන් |
|---|---|---|---|
| (i) | ණයගැතියන් | - | බොල් හා අඩමාන ණයගැතියන් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියක් නොතිබුණි. |
| (ii) | වත්කම් කළමනාකරණය | - | ස්ථාවර වත්කම් අයිතම හඳුනාගැනීමේ අරමුණු සඳහා ලේබල්ගත කර නොතිබුණි. |
| (iii) | ගිණුම්කරණ පද්ධතිය | - | නිසි ජර්නල් සටහන් කිරීමේ ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබුණු අතර, ලෙජරයෙහි සටහන් කිරීම සඳහා ජර්නල් සටහන් වෙනුවෙන් වවුචර පවත්වාගෙන යනු නොලැබේ. |